ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමවල මූලික ලක්ෂණ

| ලක්ෂණ | | ණය යෝජනාව | | |
|---|---|---|---|---|
| | | සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය (ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය) | සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය (අදියර 2) | ණය ඇප ආවරණ සහ පොලී සහන ණය යෝජනා ක්‍රමය |
| 1. | නීතිමය ප්‍රතිපාදන | මුදල් නීති පනතෙහි 88 වැනි වගන්තිය ප්‍රකාරව | මුදල් නීති පනතෙහි 83 වැනි වගන්තිය ප්‍රකාරව | මුදල් නීති පනතෙහි 108 වැනි වගන්තිය ප්‍රකාරව |
| 2. | සහභාගීත්ව බැංකු | බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු | බලපත්‍රලාභී වාණිජ බැංකු පමණි | බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු |
| 3. | ක්‍රියාත්මක වන ප්‍රදේශ | මුළු දිවයින පුරා | | |
| 4. | අරමුදල් සැපයීම | ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත මගින් | මුදල් නීති පනතෙහි 83 වැනි වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් | ණය ඇප ආවරණ - ශ්‍රී ලංකා මහ බැංකුව (සංචිත),<br>පොලී සහනාධාර - ශ්‍රී ලංකා රජය (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභාංශ) |
| 5. | ක්‍රියාත්මක වන කාල සීමාව | 2020.04.01 දින සිට 2020.05.29 දින දක්වා* | 2020.06.19 දින සිට 2020.08.31 දින දක්වා | 2020.07.01 දින සිට 2020.08.31 දින දක්වා |
| 6. | සුදුසුකම් ලබන ව්‍යාපාර | 2020 අංක 5 දරණ මුදල් මණ්ඩල චක්‍රලේඛයෙහි 2 වන වගන්තියෙ දක්වා ඇති පරිදි, කොරෝනා වසංගතයෙන් පීඩාවට පත්වූ වාර්ෂික පිරිවැටුම රුපියල් බිලියන එකට වඩා අඩු ව්‍යාපාර මෙම ණය යෝජනා ක්‍රම යටතේ සුදුසුකම් ලබනු ඇත. කෙසේ වෙතත්, සංචාරක, අපනයන සහ ඒ ආශ්‍රිත අනෙකුත් සැපයුම් වල නියැලී සිටින කිසිදු ව්‍යාපාරයකට වාර්ෂික පිරිවැටුමේ රුපියල් බිලියනයක සීමාව අදාල නොවේ. | | |
| 7. | උපරිම ණය සීමාව | රුපියල් මිලියන 25 කි. | | රුපියල් මිලියන 25 කි. |
| 8. | ණය පොලී අනුපාතය | වසරකට සියයට හතරකි (4%) | | |

| | | | |
|---|---|---|---|
| 9. | සහන කාලය | ව්‍යාපාරයේ ස්වභාවය මත පදනම්ව මාස 6 ක උපරිම සහන කාලයක් | |
| 10. | ණය ආපසු ගෙවීමේ කාලය | සහන කාලයද ඇතුලත්ව උපරිම ණය ආපසු ගෙවීමේ කාලය මාස විසි හතරකි. | |
| 11. | ණය ඇප ආවරණ | අදාල නොවේ. | ණය මුදලේ ප්‍රමාණය අනුව ණය ඇප අවරණ පහත පරිදි වේ.<br>80% - රුපියල් මිලියන 0.5 ට වඩා අඩු<br>70% - රුපියල් මිලියන 0.5 සිට රුපියල් මිලියන 1 දක්වා<br>60% - රුපියල් මිලියන 1 සිට රුපියල් මිලියන 10 දක්වා<br>50% - රුපියල් මිලියන 10 සිට රුපියල් මිලියන 25 දක්වා |
| 12. | පොලී සහනාධාරය | අදාල නොවේ. | වසරකට සියයට පහකි (5%) |
| 13. | සුරැකුම් | ලබා දී ඇති ණය පහසුකමට අදාලව, ණය අවදානම අවම කිරීම සඳහා සහභාගීත්ව බැංකු විසින් සුදුසු සුරැකුමක් ලබා ගත හැකිය. | ව්‍යාපාරයේ ශක්‍යතාවය/මුදල් ප්‍රවාහය සැලකිල්ලට ගනිමින් සහභාගීත්ව බැංකු විසින් ණය ලබා දීම අපේක්ෂා කෙරේ. |

* බලපත්‍රලාභී විශේෂිත බැංකු 2020 අගෝස්තු මස 31 දින දක්වා මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දෙනු ඇත.